# ඇමරිකාව අපට එරෙහිව යෝජනා ගෙනාවේ ඇයි?

**♦ සංජය විමලරත්න විසිනි**

**මෙ**යට උත්තර සෙවීම සඳහා දශක දෙකක් පමණ මෑත ඉතිහාසයට ආපසු ගොස් බැලීම වටී. 1990 දි පමණ සෝවියට් දේශය වැටීමෙන් පසු එකම ලෝක බලවතා ඇමරිකාව බව බටහිර උන්ගේම මාධ්‍යවලින් උදන් ඇනීමෙන් පසු ලෝකෙට ලොක්කා මමයි කියා ඇමරිකාව ටික කලක් සිතා සිටියේය. නමුත් වැඩි කල් නොගොස්ම බල තුලනය වෙනස්වන ලකුණු පෙනෙන්නට වන. ඒවා කීපයක් නම්:

**1.** ඇමරිකාව සිය පැලදොර එළිපත්ත ලෙස සලකාගෙන තිබුණු ලතින් ඇමරිකානු රටවල් තුළ ජනතාවන් නව පිබිදීමකින් සිය රාජ්‍යවල බලය වෙනස් කිරීමකට භාජනයකරන්නට වූහ. කියුබාවේ කස්ත්‍රෝගෙන් ඇරඹී තිබුණු පිබිදීම ප්‍රමාදවී හෝ ඉදිරියට ගෙනයමින් වෙනිසියුලාවේ චාවේස් ගෙන් සමාජවාදී පැත්තට බරවූ වෙනස්වීම පටන්ගැනිණ. ආර්ජන්ටිනාවේ පෙරේස්, බ්‍රෙසීලයේ ලූලා ද සිල්වා ආදී වශයෙන් එල්සැල්වදෝරය, එක්විදෝරය, පැනමාව ආදී රටවල් සියල්ලේම නව බල පෙළගැසීමක් ඇති වන්නට විය. ප්‍රබල, එමෙන්ම විශාල බලසම්පත් ඇති රාජ්‍යයන් වූ මේවාට ඇහිලිගැසීමට ඇමරිකාවට නුපුළුවන් වූ අතර වැඩිකල් නොගොස් ලතින් ඇමරිකාව ඇමරිකන්කාරයින්ට තහනම් ප්‍රදේශයක් විය.

**2.** 2000 ස් ගණන් වනවිට චීනය නව ආර්ථික නැගීමක් අරඹා තිබුණි. ඔසාමා බින්ලාඩන්ලාගේ මුස්ලිම් අල්කයිඩා ත්‍රස්තවාදය ඇමරිකාවට නව තර්ජනයක් විය.

**3.** 2003 දී අල්කයිඩාකාරයින් ඇමරිකාවටම පැමිණ කළ මහා ප්‍රහාරයෙන් ඇමරිකාව ත්‍රස්ත විරෝධී මහා අරගලයකට පැටලුණේය. මෙයින් පසු ඇෆඝනිස්ථානයේ වසර දහයක් පමණ පැටලී සිටි ඔවුහු දැන් ගොඩ එන මං බලමින් සිටිති.

**4.** 2008 දී බටහිර ලෝකය සහමුලින්ම ආර්ථික කඩා වැටීමකට භාජනය වීය. තවමත් ඒවායින් ගොඩ එන්නට බැරුව ඒ රටවල් දඟලති.

**5.** මේවායින් ගොඩඑන්නට බලමින් සිටි ඇමරිකන් උකුසු ඇසට තෙල්වලින් පිරි ලිබියාව පෙනිණ.

**6.** 2012 දී අරාබි වසන්තය ඔවුන් ඇරඹුවේ මේවායින් ගොඩ ඒමටත්, මුලු අරාබිකරයම තම ආධිපත්‍යයට ගැනීමටත් සිතාගෙනය. කාලයක සිට **CIA** කාරයින්ද, **NGO** කාක්කන් ද රිංගවා පිඹුරුපත් සාදා තිබුණ ද වැඩපිළිවෙල සම්පූර්ණයෙන් සාර්ථක නොවී ය. ඊජිප්තුවේ ඇමරිකන්කාරයින් ඇටවූ මුස්ලිම් සහෝදරත්ව කල්ලිය (Muslim Brotherhood) දැන් ඇමරිකන් විරෝධී වී ඇත. ලිබියාවෙන් ද තෙල් හිතුපරිදි ඇමරිකානුන්ට ගෙනගිය නොහැක. ඒ පළාතම අරාජික වී තිබේ.

ඇමරිකන් හිතවාදී සවුදි අරාබියාව අද ඉස්සරටත් වඩා මිලේච්චව හැසිරෙයි. මැදපෙරදිග ඇමරිකන් මුර බල්ලාව සිටි ඊශ්‍රායෙලය අද ඇමරි කාවටවත් පාලනය කරගත නොහැකි ය. ඇමරිකාව උදන්ඇනූ මුලු 2012 අරාබි වසන්තයම අද " ඇමරිකාව නැටූ තොවිලෙකුත් නැත, බෙරේ පලුවකුත් නැත," කියන තත්වයට පත්ව තිබේ.

## ඇමරිකන් උකුසු ඇස යොමුවී ඇති නව ඉලක්ක

දැන් ඇමරිකානු උකුසු ඇස යොමුවී ඇත්තේ දකුණු ආසියා ප්‍රදේශයටය. මැදපෙරදිග සඳහා අරාබි වසන්තය සැළසුම්කරන විටද ඇමරිකාවේ බැල්ම මේ ප්‍රදේශයටද යොමුකර තිබුණි. ඔවුන්ට හතුරෙකු ලෙස පෙනුණු චීනය වටා සිය බල ප්‍රදේශයක් ගොඩනගා ගැනීම දැන් ඇමරිකානු අභිප්‍රාය වෙයි.

ගිය වසරේ අරාබි වසන්තය ගෙනගිය අතරේදීම හිලරි ක්ලින්ටන් නෝනා එවිට ආරක්‍ෂක ලේකම් වශයෙන් මියන්මාරයට (බුරුමයට) පැමිණ අවුන් සා සුකී සමග ප්‍රසිද්ධියේ පෙනී සිට සාකච්ඡා පැවැත්වූවේද එහි බලයේ තවමත් සිටින යුද හමුදා ආණ්ඩුව සමග මිත්‍රත්වය ගොඩනගා ගැනීමේ ප්‍රයත්නය කළේද මේ අරමුණ සඳහාය. චීනයේ සතුරෙකු ලෙස සාමාන්‍යයෙන් සැලකෙන ඉන්දියාව සමගද සබඳකම් දැන් වැඩි කරගෙන ඇත. " මගේ සතුරාගේ එදිරිවාදියා මා මගේ වාසියට මිතුරෙකු කරගත යුතුය" යන න්‍යාය උඩ දැන් ඉන්දියා-ඇමරිකා සබඳකම් කෙරෙයි.

අනෙක් පැත්තෙන් දැන් දැන් ලංකාව සහ පකිස්ථානය චීනය සමග සිය සබඳතා තහවුරු කරගනිමින් සිටිනු ඇමරිකාව නොරිස්සයි. පකිස්ථානය දීර්ඝ කාලයක් තිස්සේ ඇමරිකන් ගැත්තෙකු වී සිටියද වසර කීපයකට ඉහත සිට එම මිතුරුදම් බිඳ වැටී ගිය සැටි අපි දුටුවෙමු.

ඇමරිකාව ඉන්දියාවට ළංවන්නේද දකුණු ආසියාවේ පය ගසාගැනීමේ තව පියවරක් වශයෙනි. මන්මෝහන්සිංගේ කොන්ග්‍රස් පක්‍ෂ සභාග රජය බලයේ එල්ලී ඉන්නා දුර්වල ආකාරය ද ඇමරිකාව දනී. නමුත් 2004 ඡන්දයෙන් හෝ එයට පෙර කොන්ග්‍රසය වැටුණ හොත් බලයට එන්නේද අප සමග අද හිතවත්කම් දක්වන සුබ්‍රමනියම් සාමි නායකත්වය දරණ ජනතා පක්‍ෂය ප්‍රමුඛ සභාග රජයකි. අප මෙන්ම ඉන්දියානු දේශපාලනයේ ස්වභාවය දන්නා ඇමරිකාව ඒ වන විට ඒ අය සමග කොක්ක ගසාගන්නවා ඇත. දේශපාලන බලය කියන්නේ එයයි.

ඇමරිකාවෙ දකුණු ආසියාවේ පය ගසාගැනීමට දැන් බාධකයක් වී ඇත්තේ පකිස්ථානය සහ ශ්‍රීලංකාව චීනය සමග ඇති සබඳකමයි. ලංකාවට ආසියා ප්‍රදේශයේ යම් පිළිගැනීමක් තිබෙන බව ඇමරිකාව දනී. මෙවර ජිනීවා ඡන්දයද එය තහවුරු කළේය. දැන් අප රට අස්ථාවර කරන්නට දඟලන්නේ මේ නිසයි. අප රට අස්ථාවර කරන්නට ඇති හොඳම ආයුධයක් නම් අපට වෛරකරන කොටින්ය. උන් ත්‍රස්තවාදීන් හෝ ඕනෑම වර්ගයේ ජඩ රැළක් වුවද ඇමරිකාවට කමක් නැත. ත්‍රස්ත ඔසාමා බින් ලාඩන් ගොඩ නගා සිය වාසියට යොදාගත් ඇමරිකාවට කොටියන් වැළඳගැනීම මහ කජ්ජක්ද?

ඉතින් මේ යෝජනා ගෙනාවේ කාටවත් ඇති ආදරයකට නොවේ. චීනයද විනාශකර දමා මුළු ලෝකයම අස්ථාවර කරලීමට ඇමරිකාවට ඇති නරුම ගතිය නිසයි.

## ජිනීවාවෙන් පසු යථාර්ථය

ජිනිවා යෝජනා සම්මත කරගැනීමෙන් පසු ඇමරිකානුන් අපට විරුද්ධව පියවර ගනීවියයි අපේ බොහෝ අය බයවී සිටිති. උන් විසින් කළ හැකියයි සිතන දේවල් නම් :

ලංකාව උන් කියන ආකාරයට කටයුතු නොකළ හොත් අපට විරුද්ධව ආර්ථික හා වෙනත් සම්බාධක (economic and other sanctions )ගෙන ආ හැකිය යන්න.

ඇමරිකාව, එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ තවත් සාමාජික රටක් පමණි. එය අප තදින් මතක තබාගත යුතුය.

රටකට විරුද්ධව මොනම ආකාරයකට හෝ සම්බාධක ගෙන ආ හැක්කේ ආරක්‍ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා එම මණ්ඩලය විසින් පමණකි. ඒ සඳහා එහි බහුතරයේ අනුමැතිය අවශ්‍යය. එහි සාමාජිකයින් අතර රුසියාව, චීනය, ඇමරිකාව, බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය ස්ථාවර සාමාජිකයෝ වෙති. (permenent members) විටෝ **veto** හෙවත් නිෂේධබලය ඇති ප්‍රබල තත්වය ඇත්තේ මේ රටවලට පමණකි. යෝජනාවක් සම්මතවීමට මේ පස් දෙනාගේම එකඟත්වය හා මණ්ඩලයේ බහුතරයේ අනුමැතිය අවශ්‍යය. මුළු මණ්ඩලයම කැමති වුනත් නිෂේධබලය ඇති එක රටක් හෝ අකමැති නම් ගෙනෙන යෝජනාව ඉවතට විසිවේ. මේ නිසා චීනය හෝ රුසියාව අප සමග සිටින තාක් ඇමරිකාව ඔලුවෙන් හිටගත්තත් අපට එදිරිව සම්බාධක ගෙන ආ නොහැකිය.

උදාහරණයක් ගතහොත් වැඩියෙන්ම වාරයක් නිෂේධ බලය පාවිච්චි කොට ඇත්තේ (100 වාරයකට වඩා) ඇමරිකාවයි. ඒ ඊශ්‍රායෙලය බේරා ගැනීමටය. ඊශ්‍රායෙලය කර ඇති වැරදි වැඩ නිසා ඇමරිකාව නොසිටින්නට එහි දූවිලිවත් ඉතුරු නොවනු නියතය. ඇමරිකාව ද මේ තත්වය දනී. ඒ නිසා ඔවුන් අපට තහංචි ගෙන එන්නේ නැත.

## යුද අපරාධ චෝදනා අප රටට විරුද්ධව ගෙන ආ හැකිය යන්න තව මිත්‍යා බියකි.

රටකට එරෙහිව යුද්ධ අපරාධ චෝදනා ගෙන ආ හැක්කේද ක්‍රම දෙකකින් එකක් මගින් පමණකි. පළමු ක්‍රමය නම්, ආරක්‍ෂක මණ්ඩලය මගින් යුධ අපරාධ උසාවියක් පිහිටුවා ලීම මගිනි. එවැන්නකට රුසියාව හෝ චීනය කිසිසේත් ඉඩ දෙන්නේ නැත.

අනිත් ක්‍රමය නම්, ඕනෑම සාමාජික රටක් මගින් එවැනි විමර්ශණයක් කරන්න යයි ජාත්‍යන්තර අධිකරණයට ඉල්ලීමක් කිරීමෙනි. නමුත් එවැන්නක් ක්‍රියාත්මක කළ හැක්කේ විමර්ශනයට ලක්විය යුතු රට ජාත්‍යන්තර අධිකරණය ස්ථාපිත කළ රෝම ප්‍රඥප්තියට එකඟ වී, එය පිළිගෙන, අත්සන් තබා සිටිය රටක් නම් පමණකි. (ඇමරිකාව එසේ කොට නැත. ඒ ඉදිරිය බලා කපටිකමටය. අප රට ද එයට එකඟවී හෝ අත්සන් තබා හෝ නැත. (මෙය අපේ දක්‍ෂකම නිසාද වාසනාවකට වූ දෙයක්ද යන්න නොදනිමු. )

මේ නිසා ජාත්‍යන්තර අධිකරණය හරහා අපට එරෙහිව ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කළ නොහැකිය.

---

## ඔබට මගෙන් වචනයක් !

**මෙ**පමණ දීර්ඝ කාලයක් තිස්සේ හැම මසකම පාහේ ලංකා විත්තියට දේශපාලනමය ලිපියක් මා ලියූයේ දේශීය හා විදේශීය නිවැරදි පුවත් මගින් ලාංකික පාඨක ඔබ දැනුම්වත් කරන්නට මගෙන් කිසියම් කාර්යයක් ඉටුවිය යුතුයයි යන අදහසිනි. එසේම ඒ ලිපි ඔබ කියවා බලා මා ලියූ කරුණු අගේ කරමින් මට නොයෙක් වර ප්‍රශංසා කළ බවද මට දැනගත හැකිවීය. ඒ අසා මට ඇතිවූයේ ඉමහත් සොම්නසකි. ඒ ගැන ඔබට ස්තුතිවන්ත වෙමි.

පුවත්පතක කාර්යය විය යුත්තේ මොනවා හෝ ලියා පිටු පිරවීම නොව ඒ ලියන දේ මගින් පත්‍රය කියවන අයගේ දැනුම වර්ධනය කිරීමයි. ලංකාවිත්තිය එය ඉටුකරන්නට ඉතා මහන්සිවූ බව පමණක් අපට කිව හැකිය. එය ඔබ ද වටහාගෙන ඇතුවා නිසැකය. විශේෂයෙන් යුද්ධය පැවති සමයේ ලංකාවේ දේශපාලන තත්වය අපි නිවැරදිව සටහන් කළෙමු. ලංකාවිත්ති කියවූ ලංකාවේ ජීවත්වන පාඨකයෝද මේ පුවත්පතින් මා ලියූ දේශපාලන ලිපිය වඩා නිවැරදියයි පිළිගෙන තිබුණාහ. ඔවුහු දැනුදු එසේ කල්පනා කරති.

එහෙත් ඔබෙන් සමුගන්නට මට සිදුව තිබේ. මේ ඉහත පළවන්නේ මගේ අවසාන ලිපියයි. වසර **16** ක් පුරා මගේ ලිපි කියවූ, ඒවා අගේ කළ ඔබට ඉතා සුබ අනාගතයක් පතමින් නවතිමි !

**- සංජය විමලරත්න**

---

ලංකාවිත්ති
LANKA VITHTHI

# සංවත්සරය සහ අවසාන හමුව

**16th Anniversry of Lanka Viththi and its final meeting to say Goodbye !**

**Please do come! We would like to see you there.**

**2013 මැයි May 4 වන සෙනසුරාදා සවස 3 - 6 දක්වා**

**St Johns Church Hall**
**3 Crawford Avenue**
**Sudbury - Wembley HA0 2HX**

වසර 16 ක් ඔබ ඇසුරේ සිට මෙසේ සමුගැන්මට වීම කණගාටුවකි!

***හිතවතුනි එන්න! අප හා වචනයක් දොඩා යන්න !***

**පසුගිය වසර දහසය මුළුල්ලේ ලංකාවිත්ති පුවත්පතට දැන්වීම් සැපයීමෙන් එහි පැවැත්මට ඉමහත් ලෙස දායක වූ ආයතනයන්හි නම් ලැයිස්තුවක් මෙහි පළකරන්නේ ඒ ආයතන කෙරෙහි අප තුළ ඇති නොවක් කෘතඥතාව පළකරනු සඳහා ය. අපට අමතකවීමකින් කිසියම් නමක් එහි සඳහන් නොවී ඇත්නම් එයට අපට කමාකළ මැනවි.**

We thought of publishing a list of names of the institutions that have been generously giving us their support for the past 16 years by placing adverts in Lanka Viththi. If a name is not appeared there, please excuse us for our mistake.

**♦ Bank of Ceylon (UK) Ltd ♦ Fast Cash (CEC ) Ltd**
**♦ Duke's Court Travel ♦ Taprobane Travel**
**♦ Trico Shipping & Forwarding Ltd ♦ Lihiniya Restaurant**
**♦ Antons Solicitors ♦ Shanthi & Co - Solicitors**
**♦ Festival of Cricket (FOC) ♦ Sam's Chicken**
**♦ Fare Deals Travel & Tours ♦ Norma & Co Solicitors**
**♦ Glen Carriers Ltd ♦ Overseas Lanka Shipping**
**♦ Euro Lankan Supermarket ♦ Perera & Co Solicitors**
**♦ Sekera Restaurant ♦ Kingsbury Autocare Ltd**
**♦ Prince of Ceylon Restaurant ♦ Bevan Perera & Co**
**♦ Uniwest International ♦ Hegoda & Hegoda Solicitors**
**♦ Budget International Calls ♦ Perma International**
**♦ Ceylon Shipping Corp Ltd ♦ Sampath Calls**
**♦ Visakha OGA (UK) ♦ Samco Food ♦ Art Lanka UK**
**♦ PKrama & Co Solicitors ♦ Athuraliyage Solicitors**
**♦ Kandy Traders ♦ Global Electroteks Ltd**
**♦ The Sinhala Centre ♦ Ranjith ♦ Namal**
**♦ Hela Sarana ♦ Dayawansa Jayakody & Co**
**♦ Mortgageforce ♦ Galle Cafe ♦ Serendib Lanka Travels**
**♦ World Air Travels ♦ UK Immigration Services**
**♦ Mahinda Collage OBA (UK) ♦ Transil Travel**

## A message to all our Advertisers

**Dear Respected Organization,**

It is with much regret that I convey to you the news of our being forced to terminate the publication of **Lanka Viththi** due to unavoidable circumstances.( Please consider the current issue as our last)

The successful continuation of a publication like **Lanka Viththi** distributed free, depends much on the goodwill and support of the readership and the advertisers which we were fortunate to receive in plenty throughout the last sixteen years.

On behalf of the readership and the organisers, I wish to personally convey my grateful thanks to your organisation for the unrestrained support given to **Lanka Viththi** over the whole period of publication. (By this you have also contribu-ted to the national cause to which we have committed ourselves).

While thanking you again, we also convey to you our best wishes for the future prosperity and success of your organisation.

Yours sincerely

**Daya Ananda Ranasinghe** - ***The Editor - Lanka Viththi***